කොළඹ අධ්‍යාපන කලාපය
දෙවන වාර පරීක්ෂණය - 2012

# බුද්ධ ධර්මය
(I කොටස )

**07 වන ශ්‍රේණිය**

නම/ විභාග අංකය ..........................................................

මිනිත්තු 30

* ප්‍රශ්න සියල්ලටමපිළිතුරු සපයන්න.
* නිවැරදි පිළිතුරට ලකුණු 02 බැගින් මුළු ලකුණු සංඛ්‍යාව 40 කි.

---

- වරහන් තුළ දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

(සැලසුම් සහගතව, මෛත්‍රිය, සයක්, උද්භිද විද්‍යාත්මක, ආදිත්තපරියාය සූත්‍රය)

(01) බුදුරාජාණන් වහන්සේ දෙසූ ................................ අසා ජටිල සහෝදර භික්ෂූහු රහත් ඵලයට පැමිණියහ.

(02) පොල් ගෙඩියෙන් පොල් පැළයක්ම මිස කොස් පැළයක හට නොගන්නේ ................................ නියාමය ක්‍රියාත්මක වීම නිසාය.

(03) එකම දරුවකු ඇති අම්මා කෙනෙකු සිය දරුවා රැක බලාගෙන යහපතම කරන්නාක් මෙන් අපි සියළු දෙනාටම ................................ කිරීමට පුරුදු වෙමු.

(04) "ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ........" යන දහම් ගුණ පාඨයෙහි ධර්ම රතනයේ ගුණ ................................ ගැන කියවෙයි.

(05) කෙත පාළු වූ ගොවියාගේ කතාවෙන් නියමනය කරන්නේ බුදුරජාණන් වහන්සේ ................................ අසරණයන්ට පිහිට වූ වගයි.

- පහත සඳහන් වාක්‍ය හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති කොටුව තුළ යොදන්න.

(06) පඤ්චශීල ප්‍රතිපදාව ගේහසිත ශීලය නමින්ද හඳුන්වයි. ☐

(07) උගන්වන දෙයට හොඳින් ඇහුම් කන් දීම යහපත් සිසුවාගෙන් ගුරුවරයාට ඉටුවන යුතුකමකි. ☐

(08) ගිලන්ව සිටි මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ මොග්ගලානත්ථෙර බොජ්ඣංග සූත්‍රය අසා සුවපත් වූ සේක. ☐

(09) විශාඛාව සැමියාට මෙන්ම සැමියාගේ ඥාතීන්ට ද අනතිමානීව සංග්‍රහ කළාය. ☐

(10) පස්පව් දස අකුසල් අයත් වන්නේ වාරිත්‍ර ශීලයටය. ☐

● ''ආ'' කොටසේ දක්වා ඇති යෙදුම් ''අ'' කොටසේ එන යෙදුම් සමඟ කුමන ආකාරයක හෝ සම්බන්ධතාවයක් දක්වයි. එම සම්බන්ධතාවය 'අ' කොටසින් තෝරා යා කරන්න.

| | 'අ' කොටස | 'ආ' කොටස |
|---|---|---|
| (11) | බෞද්ධ සිරිත් විරිත් | මෙහෙණි සස්න |
| (12) | සහජීවනය | ත්‍රිකෝටික පාරිශුද්ධි ශීලය |
| (13) | ධම්මික සූත්‍රය | විනය භාණක පරම්පරාව |
| (14) | අනුලා දේවිය | සිරිත් මල් දම |
| (15) | උපාලි තෙරුන් හා ශිෂ්‍ය පිරිස | දුක සැප එක්ව බෙදාගැනීම. |

● පහත සඳහන් ප්‍රශ්න වලට කෙටි පිළිතුරු දී ඇති හිස්තැනේ ලියා දක්වන්න.

(16) දෙමව්පියන්ට නොසලකන්නා

.................................................................................................................................

(17) ආගන්තුකයන්ට සංග්‍රහ කිරීම.

.................................................................................................................................

(18) අඹු දරුවන් පෝෂණය කරමින් කාම භෝගී ජීවිත ගත කරන්නා.

.................................................................................................................................

(19) සිත එක අරමුණක තැන්පත් කර ගැනීම.

.................................................................................................................................

(20) කාය වාක් සංවරය.

.................................................................................................................................